විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
Foreign Agencies & External Affairs Branch
Ministry of Education
Tele/Fax 0112785476 Ext 1315,1316,1317

---

රාජකාරි විදේශ නිවාඩු අනුමත කර ගැනීමට විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතු ප්‍රධාන ලේඛන වලට අතිරේකව - **පශ්චාත් උපාධි සඳහා රාජකාරි විදේශ නිවාඩු අනුමත කර ගැනීමට ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලේඛන**

## විදේශ ගතවීමට පෙර

01.අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සකස් කරන ලද ගිවිස්නාව (පිටපත් 04 කින්)

a) එම ගිවිස්නාවේ සියළු කොටස් සම්පූර්ණ කර රු 50.00 මුද්‍රයක් මත අත්සන් තැබිය යුතුය.

b) ඊට අදාල සාක්ෂිකරුවන් දෙනෙකුගෙන් අත්සන හා නිලමුද්‍රාව ලබා ගත යුතුවේ.

02.ආයතන සංග්‍රහයේ 15 වැනි පරිශිෂ්ටය (පිටපත් 04 කින්)
(සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබන නිලධරයන් අත්සන් කළ යුතු බැදුම්කරයේ ආකෘතිය)

a) එම බැදුම්කරය සියලු කොටස් සම්පූර්ණ කර හිස් තැන් ඇති සෑම ස්ථානයකම දෙපස මේ සඳහා සාක්ෂිකරුවන් වශයෙන් ඉදිරිපත් වන දෙදෙනාගේ හා අදාල නිලධාරියාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

b) සාක්ෂිකරුවන් වශයෙන් ඉදිරිපත් වන දෙදෙනාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක් ලබා දිය යුතුවේ.

c) ඉහත අත්සන් කරන ලද සාක්ෂිකරුවන් දෙදෙනාගේ වර්තමාන ලිපිනය ජාතික හැඳුනුම්පතේ ඇති ලිපිනය සමග නොගැලපේනම් එය සනාථ කිරීමට සාක්ෂියක් ඉදිරිපත් කළ යුතුවේ. (බැංකු පාස්පොතේ පිටපත ආදී......)

d) මෙම බැදුම්කරය රජයේ ප්‍රසිද්ධ නිතිඥ විසින් නිලමුද්‍රාව යොදා අත්සන් කළ යුතුවේ.

03.මීට පෙර විදේශ ශිෂ්‍යත්වයක් ලබා ගෙන නොමැති බව පෞද්ගලික ලිපිගොනුව මඟින් ලබා ගත් ලිපිය.

04. අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර මාසයේ ලබා ගත් වැටුප් වාර්තාවේ සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුවේ.

05.පාඨමාලා ගාස්තු හා අනෙකුත් අදාළ වියදම් මිලියන 08 ඉක්මවන්නේ නම් එම අමතර වියදම දරන්නේ කවුරුන්ද යන්නට ලිඛිත සාක්ෂි.